www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# 2010 දී එක්සත් ජනපදයේ යථා තත්වය

## The real state of the union in 2010

2010 ජනවාරි 30

බදාදා රාත්‍රියේ සිදු කරන ලද තම "රාජ්‍ය තත්ව" කථාවේදී එක්සත් ජනපද සමාජයේ යථා තත්වය පිලිබඳ කවර හෝ සෘජු සහ සංයුක්ත ඉදිරිපත් කිරීමකින් ජනාධිපති බැරැක් ඔබාමා වැලකුනි. දැවැන්ත ආර්ථික අර්බුදය හා දස ලක්ෂ සංඛ්‍යාත ඇමෙරිකානුවන් මත එහි විනාශකාරී බලපෑම මධ්‍යයේ එය මග හැර යාමට දරන ලද ප්‍රයත්නයන් සහ නීරසභාවය සම්බන්ධයෙන් ගත් කල ඔබාමාගේ කථාව අත්‍යසාමාන්‍ය විය.

අර්බුදය පිලිබඳව ඔහු කතා කලේ එය සමාන්‍ය දෙයක් ලෙස හැගෙන පරිදි වුවද එය සනාථ කිරීම සඳහා කරුනු ඉදිරිපත් කලේ නැති තරම්ය. සාමාන්‍ය ඇමරිකානුවන් මුහුන දී සිටින ශෝචනීය තත්වය පිලිබඳව සානුකම්පිකභාවයක් මවා පෙන්වීම සඳහා විවිධාකාරයේ පූර්විඥානම් ඔහු විසින් යොදා ගනු ලැබූව ද ඔබාමාගේ කථාවෙන් අනාවරනය වූයේ පටුබවේ ගැඹුර සහ ඔහු පමනක් නොව සමස්ත දේශපාලන සංස්ථාපිතය ම පුලුල් මහජනතාවගෙන් වෙන් කෙරෙන නොතැකීම පමනකි.

"වසරකට පසු කුනාටුවේ දරුනුම කොටස පසු කොට ඇත" යනුවෙන් ප්‍රකාශ කරමින් ඔහු කථාව ඇරඹුවේ මූල්‍ය පද්ධතිය රැක ගැනීම සඳහා ඔහු විසින් ගනු ලැබූ "ආක්‍රමනශීලී" පියවරයන් ආරක්ෂා කරමිනි. ඇත්තටම? කොටින්ම අහනවනම් මේ කුනාටුව අවසන් වී ඇත්තේ කාටද?

පිලිතුර පැහැදිලිය - මෙම ආර්ථික ව්‍යසනයට හේතු කාරක වූ සමපේක්ෂනයන් හි යෙදී ගත් මූල්‍ය පරපෝෂිතයන්ට නම් කුනාටුව පහව ගොස් ඇත. කම්කරු පන්තියේ තත්වය වඩාත් නරක අතට හැරී ඇත. නිවෙස් උගසට සින්නවීම් සහ බඩගින්න වාර්තාගත ඉහලකට ලගාවී ඇති අතර දරිද්‍රතාව වේගයෙන් වැඩෙමින් පවතී. වසරකට පෙර ඔබාමා ජනාධිපති ධූරය බාර ගන්නා විට නිල විරැකියා මට්ටම සියයට 7.6 ක් වූ අතර දැන් එය සියයට 10 කි - එනම් සියයට 31 ක පිම්මකි.

ඔබාමා මෙම බලගතු ප්‍රකාශයෙන් අනතුරුව අනිච්ඡානුකව මෙන් කම්කරු පන්තිය මුහුන දෙන අර්බුදය පිලිබඳව සඳහනක් කලේය. "ඇමරිකානුවන් දස දෙනෙකුගෙන් එක් අයෙකුට රැකියාවක් සොයා ගත නොහැක" යැයි ප්‍රකාශ කල ඔහු "බොහෝ ව්‍යාපාර වැසී ගියේය. නිවාස වටිනාකම පහත වැටුනි. විශේෂයෙන්ම කුඩා නගර වලට සහ ගම්බද ප්‍රජාවන්ට බරපතල ලෙස පහර වැදුනි" යැයි සඳහන් කලේය.

මහා අවපාතයෙන් පසු ඇතිවූ ගැඹුරුතම ආර්ථික අර්බුදය ගැන ඔහුට කීමට තිබුනේ එපමනකි.

වැඩෙන අතෘප්තියේ ඇඟවුම් ගැන කතා කරමින් ඔහු පැවසුවේ එය යථා කරුනු හා යථා තත්වයන් වලට දක්වන සමස්ත වශයෙන් තාර්කික ප්‍රතිචාරයක් නොවන ජනප්‍රිය දුරවබෝධයක් බවයි. "ඔවුහු එය අවබෝධ කර නොගනිති.... මන්දයත් ඔවුන් එය දැකගන්නේ වෝල් වීදියට වාසිදායක වන මහා වීදියට බලගතු ලෙස පහර වදින නරක පැවැත්මක් ලෙසිනි. එසේත් නොමැතිනම් අපේ එකදු ප්‍රශ්නයක් හෝ විසඳීමට වොෂින්ටනය අසමත් වන්නේ හෝ අපේක්ෂා නොකරන්නේ මන්ද? යනුවෙනි."

"පෙනීයන" එකම දෙය නම් මූල්‍ය ප්‍රභූවේ වත්කම් සුරක්ෂිත කිරීම සඳහා ඔබාමා පරිපාලනය තම පිලිවෙත් නාභි ගත කොට ඇති බව හා දේශපාලන පද්ධතිය ජනගහනයේ අවශ්‍යතා සහ අභිලාෂයන් නොතකන බවයි.

මිලියන දෙකක රැකියා "රැකගත්" බවට හා "ආර්ථිකය නැවතත් වැඩෙමින් පවතින" බවට වෙනත් අවස්ථාවක දී ඔබාමා පුරසාරම් දෙඩවීය. අඥාන මහජනයාට පෙනෙන තරමට දේවල් නරක නැත.

ඒ හා සමානව ම ඔහුගේ සෞඛ්‍ය ආරක්ෂක වැඩ පිලිවෙල සම්බන්ධයෙන් වැඩෙන මහජන විරෝධය ද දුරවබෝධයට පැවරීය. "එම චෝදනාවෙන් මට හිමි කොටස එනම් ඇමරිකානු ජනතාවට එය වඩාත් පැහැදිලිව ඉදිරිපත් නොකිරීම සම්බන්ධයෙන් වගකීම මම භාර ගනිමි." සැබැවින්ම සිදු වූයේ ආන්ඩුවේ ප්‍රචාර ව්‍යාපාරය තුලින් සංඛ්‍යාත්මකව වැඩෙන මහජනතාවක් ආන්ඩුවේ යථා සැලසුම කුමක්ද යන්න; එනම් මිලියන සංඛ්‍යාත කම්කරුවන් සහ විශ්‍රාමිකයින් භුක්ති විඳිමින් සිටින සෞඛ්‍ය පහසුකම් වලට කෙටීම සහ සීමා කිරීම දැක හඳුනා ගනු ලැබීමයි.

"ඇමරිකානු ජනතාවට" ගැයෙන බොහෝ වංක ප්‍රශස්තීන්ගෙන් එකක් ගයමින් ඔවුන් ගොනාට ඇන්දවීමේ අදහසින් "ඔවුනගේ අති මහත් විනීතභාවය සහ සුවිසල් ජවය හේතුවෙන් අපේ රාජ්‍යය ශක්තිමත්යැ" යි ඔබාමා ප්‍රකාශ කලේය.

එක්සත් ජනපදය තුල සහ ජාත්‍යන්තරව වැඩෙමින් පවත්නා දේශපාලන තත්වය පිලිබඳ මේ මස මුල දී සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) ජාතික සමුලුවට ඉදිරිපත් කරන ලද වාර්තාව ලබන සඳුදා ලෝක *සමාජවාදී වෙබ් අඩවියේ* පල කෙරේ.

සසප ජාතික සභාපති ඩේවිඩ් නෝර්ත් ගේ සහ සසප ජාතික ලේකම් ජෝ කිශෝර් ගේ සම කර්තෘත්වයෙන් ඉදිරිපත් වූ මෙම වාර්තාව මගින් එක්සත් ජනපද සහ ලෝක ධනවාදයේ අර්බුදය එහි ඓතිහාසික සන්දර්භය තුල පිහිටුවමින් විප්ලවවාදී පන්ති අරගලයන්ගේ නව කාල පරිච්ඡේදයකට තුඩු දෙන ප්‍රධාන ගාමක බලයන් විභාග කෙරේ.

මෙම වාර්තාව ඇමරිකානු සමාජයේ සහ දේශපාලනයේ තත්වය පිලිබඳව වෛෂයික විශ්ලේෂනයක් ඉදිරිපත් කරයි. "රාජ්‍ය තත්වය" පිලිබඳ අපේ තක්සේරුවේ පෙර දැක්මක් ලෙස එම වාර්තාවෙන් කොටස් කීපයක් මෙහිදී ඉදිරිපත් කරමු.

ඔබාමා පරිපාලනයේ ප්‍රමුඛතාවයන් පිලිබඳව වාර්තාව මෙසේ පවසයි.

ඔබාමා පරිපාලනයේ පලමු ප්‍රමුඛතාව වූයේ තම වත්කම් ආරක්ෂා කර දෙන බවට සහ වෝල් වීදියේ සූදු මත "නව පිලිවෙත" ආකාරයේ බාධාවන් නැවත නොපනවන බවට මූල්‍ය ප්‍රභූවට යලි සහතිකවීමයි. නමුදු සිදුවූයේ එහි ප්‍රතිවිරුද්ධයයි. ලෝක මූල්‍ය පද්ධතියට දැවැන්ත මුදල් කන්දරාවක් මුදා හැරීම, සිදුවිය හැකි පරිදිම, වෝල් වීදිය තුල අවදානම් සහගත සමපේක්ෂනයේ නව වටයකට තුඩු දුනි. අතිමහත් බහුතරය වන වැඩ කරන ජනයාගේ ගැඹුරු අතෘප්තියට කවර හෝ ආමන්ත්‍රනයක් නොකෙරෙන තතු තුල ධනවත් සමපේක්ෂකයන් ආඪ්‍ය කරමින් කොටස් මිල ගනන් ඉහල නැගුනි.

විසි එක් වන සියවසේ දෙවන දශකය සහ ඔබාමා පාලනයේ දෙවන වසර ආරම්භයේදී සමාජ කොන්දේසි පිලිබඳව වාර්තාවේ මෙසේ සඳහන් වේ:

එක්සත් ජනපදය තුල ජනගහනයෙන් පුලුල් ජන ස්කන්ධයක ජීවන කොන්දේසි එකදිගටම විනාශ වෙමින් පවතී. මිලියන 6 ක ජනයා (ජනගහනයෙන් සියයට 2ක්) මොනයම් හෝ ආදායමක් නොමැතිව ආහාර මුද්දර වලින් රැකෙද්දී මිලියන 40 ක් ජනයා දරිද්‍රතාවේ ජීවත් වෙති. දශකය අවසන් වන විට නිල විරැකියා ප්‍රතිශතය සියයට 10 දක්වා ඉහල නැගුනු අතර 2009 දී පමනක් රැකියා මිලියන 4.2 ක් අතුගා දැමින. නිල කම්කරු බලකාය ජනවාරි මාසයේදී 661,000 කින් හැකිලුනු අතර එමගින් විරැකියාවේ පුලුල් මිනුම 17.3 දක්වා ඉහල නැගුනි. මෙම ප්‍රතිශතයට අකමැත්තෙන් අර්ධ කාලීන රැකියාවල යෙදෙන මිලියන සංඛ්‍යාත ජනයා ද අඩංගු වේ.

සමහර ජනපද සහ නගර තුල, අර්බුදය අවපාතයක කොන්දේසි කරා මේ වන විටත් ලඟා වී ඇත. මිචිගන්වල විරැකියාව සියයට 14.7 කි. ජනපදයේ සුවිසල්ම නගරය වන ඩෙට්රොයිට් හි යථා විරැකියාව සියයට 50 ක් පමන වේ. රටේ සුවිසල්ම ජනගහනය ඇති ජනපදය වන කැලිෆෝර්නියාවේ නිල විරැකියා ප්‍රතිශතය සියයට 12.3 ක් වේ. දිගු කාලීන විරැකියාව ඇමරිකානු දිවියේ සාමාන්‍ය දෙයක් බවට පත්ව ඇති අතර විරැකියාවෙන් පෙලෙන අයගෙන් සියයට 40 කට ආසන්න ප්‍රමානයක් සති 27 ක් හෝ ඊටත් වැඩි කලක් වැඩ නැතිව ගත කොට ඇත. 2007 දී ඇරැඹුනු නිවාස මිල බිඳ වැටීම හේතුවෙන් නිවෙස් උගසට සින්නවීම් රැල්ලක් ඇති විය. 2009 අවසාන කාර්තුවේ දී ඉහලම අගය වාර්තා කරමින් දස ලක්ෂයක් නිවාස උගසට සින්න වූ අතර මේ වසර තුල ඇමරිකානුවන් ලක්ෂ 30 කට තම නිවාස අහිමි වීමට නියමිතය.

පසුගිය දශකය වනාහි එක්සත් ජනපද ඉතිහාසයේ රැකියා සම්බන්ධයෙන් නරකම දශකයකි. *වොෂින්ටන් පෝස්ට්* පුවත් පත මෑතකදී මෙසේ සටහන් කලේය; "1999 සිට ශුද්ධ රැකියා නිර්මානය ශූන්‍ය වේ. 1940 දක්වා වූ පූර්ව දශකයන්ගෙන් කවරක හෝ රැකියා වර්ධනය සියයට 20 ට අඩු නොවේ. ආර්ථික ප්‍රතිදානය ගත් කල පසු ගිය දශකය වාර්තා වන්නේ 1930 ගනන් වලින් මෙපිට අඩුම වර්ධන වේගය වාර්තා කල වසර ලෙසයි."

ඇමරිකානු කම්කරුවන්ගේ ආදායම් පහල වැටුනු අතර එමගින් ඇමරිකානු ගෘහස්ථයන්ගේ ශුද්ධ වටිනාකම් ද පහත වැටින. යථා වශයෙන් පවසතොත්, නිෂ්පාදන ඵලදායිතාව ඉහල නගිද්දී පවා 2009 වසර තුල සතියක වැටුපේ සාමාන්‍ය අගය සියයට 1 කින් අඩු විය. *ලොස් ඇන්ජලීස් ටයිම්ස්* පුවත්පතේ එක් ලිපියක් මෙසේ පවසයි; "වෝල් වීදියෙන් සහ ධවල මන්දිරයෙන් නිකුත් කෙරෙන සියලු විජයග්‍රාහී පූර්ණනම් තිබියදී ද්‍රව්‍යමය වශයෙන් ප්‍රකාශ වන්නේ මෙය ඇමරිකානු පවුල්වලට විනාශකාරි දශකයක් බවයි. වානිජ සහ කම්කරු දෙපාර්තමේන්තුවට අනුව දෙවන ලෝක යුද්ධයෙන් පසු පලමු වරට ඇමරිකානුවකු සතු ශුද්ධ වටිනාකම් හි සාමාන්‍යය සියයට 13 ක් වූ දැවැන්ත අගයකින් පහත වැටින.

2010 දී එක්සත් ජනපදයේ යථා තත්වය එසේ ය.

බැරී ග්‍රේ

© www.wsws.org